පළාත් සැලසුම් චක්‍රලේඛ අංක 2018/01

මගේ අංකය:- NCP/CS/PD/D/චක්‍රලේඛ

ප්‍රධාන ලේකම් කාර්යාලය,

උතුරු මැද පළාත.

2018.11. 09

උතුරු මැද පළාත් සභාවේ සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන්,

<u>සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම්කරණය විධිමත් කිරීම.</u>

සාමූහික ප්‍රදාන , පළාත් සභා සංවර්ධන ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ ලෝක බැංකු ආධාර යන අරමුදල් ප්‍රභවයන් යටතේ සංවර්ධන ව්‍යාපෘතීන් උතුරු මැද පළාත් සභාවේ විවිධ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර එම සියළු සංවර්ධන ව්‍යාපෘති මෙහෙයුම්කරණය පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.

එම මෙහෙයුම් ක්‍රියාවලියේදී අනාවරණය වූයේ වාර්ෂික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ආයතන මට්ටමේ විවිධ අඩුපාඩු පසුගිය කාලය පුරාම දක්නට ලැබුණු බවයි. එයට ප්‍රධානම හේතුව වන්නේ පළාත් සභාවේ විවිධ ආයතන තම තමන්ගේ මට්ටම්වලදී සංවර්ධන සැලැස්ම මෙහෙයුම්කරණයේදී දක්වන අකාර්යක්ෂමතාවයයි. ඒ අනුව ඉදිරියේදී සංවර්ධන සැලැස්ම ප්‍රගති සමාලෝචනයේදී පහත උපදෙස් අනුගමනය කරන ලෙස මෙයින් දන්වමි.

1. පහත ආකාරයෙන් තම ආයතනවල සංවර්ධන සැලැස්මේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා <u>රැස්වීම් පැවැත්වීම අනිවාර්යය වේ</u>.
   1.1. දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සෑම මසකම පළමුවැනි (1) හා තුන්වැනි (3) සතියේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන්. (සංවිධානය අදාළ විෂයභාර නිලධාරියා විසින්)
   
   රැස්වීම් වාර්තාව අදාළ අමාත්‍යංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුයි.
   
   1.2. අමාත්‍යංශ මට්ටමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සෑම මසකම දෙවැනි (2) සතියේදී අමාත්‍යංශ ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අමාත්‍යංශයේ ගණකාධිකාරී, අධ්‍යක්ෂ (සැලසුම්)/ සහකාර ලේකම් (සැලසුම්) යන අයගේ සහභාගීත්වයෙන්. ( සංවිධානය අධ්‍යක්ෂ (සැලසුම්)/ සහකාර ලේකම් (සැලසුම්) විසින්)
   
   රැස්වීම් වාර්තාව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ඉදිරිපත් කළ යුතුයි.

1.3. පළාත් සභා මට්ටමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සෑම මසකම තෙවන (3) සතියේදී ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ මුදල්/ ඉංජිනේරු), අමාත්‍යාංශ ලේකම්, අමාත්‍යාංශවල සහකාර ලේකම් (සැලසුම් / මුදල්) යන අයගේ සහභාගීත්වයෙන්. ( සංවිධානය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින්)

1.4. අමාත්‍යාංශයක් යටතට නොවන ආයතනයක ප්‍රගතිය සාකච්ඡා කිරීම ප්‍රධාන ලේකම් විසින් කැඳවන අවස්ථාවකදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ මුදල්/ ඉංජිනේරු), ආයතන ප්‍රධානී, සහකාර ලේකම් (මුදල්) , විෂයභාර නිලධාරීන් යන අයගේ සහභාගීත්වයෙන්. ( සංවිධානය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින්).

2. පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ සියළු තොරතුරු පළාත් සංවර්ධන සැලසුම් මෙහෙයුම් පද්ධතියට (DPMS) ඇතුලත් කිරීම අනිවාර්ය වන අතර, ඒ සම්බන්ධයෙන් වගකීම, අවධානය සහ නිරන්තර අධීක්ෂණය අමාත්‍යාංශ ලේකම් හෝ අමාත්‍යාංශයක් යටතට නොවන ආයතනයක් වේ නම් එහි ප්‍රධානියා වෙත මෙයින් බලය පවරා දෙන අතර පහත සඳහන් කරුණු කෙරෙහිද අවධානය යොමු කළ යුතුය.

සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම්කරණ පද්ධතිය යාවත්කාලීන කිරීම පිළිබඳ නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතුය.

2.1. උක්ත අරමුදල් ප්‍රභවයන් යටතේ අනුමත කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති මෙම පද්ධතියට ඇතුලත් කර ඇති බව.

2.2. මාසිකව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය යාවත්කාලීන කරන බව එහිදී තහවුරු කර ගත යුතුය.

2.3. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ලබා ගැනීම මෙන්ම මාසයකට වරක් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා මෙම පද්ධතියට ඇතුළත් කරනු ලබන දත්ත මඟින් සිදු කරනු ලැබිය යුතුය.

3. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී වාර්ෂික සංවර්ධන සැලැස්මේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) මඟින් ඉදිරිපත් කළ යුතු අතර අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් තම අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුය.

එච්.එම්.පී. බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.